**විසල් ත්‍රිකුණාමලය ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය - 2011**

**----------------------------------------------------------------**

**1.** **මතය**

**--------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 03 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2011 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයනලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම්, එම ගිණුමට ඌනපූරණය කිරීම්, ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.** **මුල්‍ය ප්‍රකාශන**

**2.1** **මුල්‍ය කාර්ය සාධනය**

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.799,619,910 ක් සහ 2008 වර්ෂය සිට 2010 දක්වා වූ ඉකුත් කාල පරිච්ඡේදය සඳහා වියදම රු.1,384,340,734 ක් වූ අතර 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.2,183,960,644 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| **විෂයය** | **2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම** | **2008 සිට 2010 දක්වා කාලපරිච්ඡේදය සඳහා වියදම** | **2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම** |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ව්‍යාපෘති කළමනාකරණ වියදම ශ්‍රීලංර | 199,794,393 | 626,663,008 | 826,457,401 |
| උපදේශක ගාස්තු - ඒඑෆ්ඩී | 18,585,126 | 18,536,851 | 37,121,977 |
| -එම- ආර්පීඊ | 55,370,426 | 107,642,098 | 163,012,524 |
| **කොන්ත්‍රාත්කරු ගෙවීම් - ඒඑෆ්ඩී** | 169,167,060 | 631,498,777 | 800,665,837 |
| **-එම- ආර්පීඊ** | 354,255,931 | - | 354,255,931 |
| **ක්ෂය** | 2,446,974 | - | 2,446,974 |
| එකතුව | 799,619,910 | 1,384,340,734 | 2,183,960,644 |

**2.2** **අග්‍රිම අරමුදල් ගිණුම**

මුල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකිවූ තොරතුරු අනුව , 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් හා 2011 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ පැවති ශේෂය පහත දැක්වේ.

| | යුරෝ | රු. |
|---|---|---|
| 2011 ජනවාරි 01 දිනට ශේෂය | 304,613 | 44,949,246 |
| **එකතු කළා :- ඌන පූරණයන්** | 734,086 | 117,549,769 |
| | ---------- | ---------------- |
| | 1,038,699 | 162,499,015 |
| **අඩු කලා - ආපසු ගැනීම්** | 848,415 | 129,791,140 |
| | ----------- | --------------- |
| | 190,284 | 32,707,875 |
| ශුද්ධ විදේශ විනිමය වෙනස | - | (4,655,669) |
| | ------------ | --------------- |
| **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **190,284** | **28,052,206** |

**3. විගණන නිරීක්ෂණ**

**---------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 පෙබරවාරි 28 දිනට හෝ ඊට පෙර විගණනයට ඉදිරිපත් කළ යුතු 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2013 ජුලි 04 දිනදීය.

(ආ) 2011 වර්ෂයේදී කාර්ය සාධන බැඳුම්කරය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියෙහි ව්‍යාපෘතිය විසින් තැන්පත් කරන ලද රු.මිලියන 4 ක මුදල ජංගම වත්කම් යටතේ වෙනම දක්වනු වෙනුවට මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ යටතේ අනුචිතව දක්වා තිබුණි.

(ඇ) මුළු ණය මුදලෙන් ණය දෙනු ලබන නියෝජිතායතනය විසින් අයකරන ලද ණය පොලී හා බැඳීම් ගාස්තුවලින් අදාළ කොටස ලබාගෙන ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා මහ බැංකුව (ශ්‍රීලංමබැ) විසින් පවත්වා ගෙන යනු ලැබූ වාර්තා අනුව 2011 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 28 කට සමාන යුරෝ 190,284 ක් විය. කෙසේ වුවද ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව, එය රු.මිලියන 73 කට

සමාන යුරෝ 494,897 ක් ලෙස දක්වා තිබුණි. එබැවින් 2011 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 45 කට සමාන යුරෝ 304,612 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළදී සාවද්‍ය ජර්නල් සටහනක් අනුමත කිරීම හේතුවෙන් 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන කෙරීගෙන යන වැඩ හා "රිසර්ව් ජේස් ඉමර්ජන්ට් " ණය රු.මිලියන 19 කට සමාන යුරෝ 164,717 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනය කර තිබූ දේපල, පිරියත හා උපකරණවල ක්ෂය රු.මිලියන 2.4 ක් අදාළ ස්ථාවර වත්කම්වල පිරිවැයෙන් අඩුකිරීමෙන් තොරව ව්‍යාපෘතියේ වගකීමක් වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

(උ) විගණනයට ඉදිරිපත් කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශය මෙහෙයුම් කටයුතු, ආයෝජන කටයුතු හා මූල්‍ය කටයුතුවලින් වන මුදල් ප්‍රවාහය වෙනම හඳුනාගත හැකිවන පරිදි පිළියෙල කර නොතිබුණි.

**4. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**4.1 අරමුදල් උපයෝජනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සැලසුම් කළ කාල පරිච්ඡේදය තුළදී වෙන්කරන ලද සම්පත් යොදා ගනිමින් ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම තහවුරු වනු පිණිස සමස්ත ව්‍යාපෘති කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි මාසිකව, කාර්තුමය හා අර්ධ වාර්ෂික වශයෙන් වගකීම් සහිතව මූල්‍ය හා භෞතික ඉලක්ක අවධාරණය කරමින් පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් තිබිය යුතු වුවද එවැනි සැලැස්මක් ව්‍යාපෘතිය විසින් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය හා 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවයන් | ප්‍රතිපාදනය සඳහා එකඟවූ මුදල | | 2011 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | වර්ෂය තුළ අරමුදල් උපයෝජනය | 2011 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|---|
| | යූරෝ මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | යූරෝ මිලියන | රු.මිලියන |
| ආසබැ | 10.35 | 1,500.75 | 270.00 | 175.00 | 6.30 | 978.03 |
| ආර්පීඊ | 12.50 | 2,062.50 | 456.00 | 307.71 | 4.64 | 718.83 |
| ශ්‍රීලංර | 6.78 | 1,087.00 | 305.00 | 196.11 | 5.20 | 834.05 |
| **එකතුව** | **29.63** | **4,650.25** | **1,031.00** | **678.82** | **16.14** | **2,530.91** |

### 4.2 භෞතික කාර්ය සාධනය

විගණනයට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය පහත පරිදි වේ.

| පැකේජ අංකය / ව්‍යාපෘති කාර්යය | 2011 දෙසැම්බර් 31 දිනට ඉලක්කය ප්‍රතිශතය | 2011 දෙසැම්බර් 31 දිනට ඉටුකර ගැනීම ප්‍රතිශතය |
|---|---|---|
| **GTIWSP/RPE/Civil Work/2007/01** | | |
| ජලය ඇතුල්වන ස්ථාන, පොම්පාගාර ඉදිකිරීම හා ජලාශ පුනරුත්ථාපනය කිරීම | 100 | 65 |
| **GTIWSP/AFD/Valves & Steel Pipes/2008/01** | | |
| වැල්ව් හා උපාංග සහ වානේ නල සැපයීම, බෙදාහැරීම සහ සවිකිරීම් | 100 | 88 |
| **GTIWSP/AFD/DI 600 Laying/2007/01** | | |
| මහවැලි ජලය ඇතුල්වන ස්ථානය සිට කන්තලේ ජල පිරිපහදු අංගනය දක්වා ඩීඅයි නල එළීම හා සවිකිරීම | 85 | 48 |

| | | |
|---|---|---|
| **<u>GTIWSP/AFD/PE Laying/2008/01</u>** | | |
| කින්නියා සැපයුම හා ඉරක්කන්ඩි දීර්ඝ කිරීම සඳහා පීඊ/ඩීඅයි නල හා උපාංග එළීම හා සවිකිරීම් | 100 | 92 |
| **<u>GTIWSP/AFD/KINNIYA TOWER/2008/01</u>** | | |
| කින්නියා ජල කුළුණ ඉදිකිරීම | 100 | 92 |
| **<u>GTIWSP/CONSULTANCY/FRENCH/AFD/2007/03</u>** | | |
| ඊච්චලම්පතායි හා පුල්මොඩෙයි ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා උපදේශක අධ්‍යයන | 80 | 35 |
| **<u>GTIWSP/RPE/TURNKEY WORKS/2008/01</u>** | | |
| කන්තලේ ජල පිරිපහදු අංගනය පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම. | 80 | 39 |
| **<u>GTIWSP/RPE/TURNKEY WORKS/E and M/2008/01</u>** | | |
| ඉලෙක්ට්‍රෝ මිකැනිකල් උපකරණ පුනරුත්ථාපනය සඳහා ටර්න්කී කොන්ත්‍රාත්තුව (ආර්පීඊ) | 80 | 39 |
| **<u>GTIWSP/CONSULTANCY/FRENCH/ 2005/01</u>** | | |
| ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඉංජිනේරු සේවා ක්ෂේත්‍ර විමර්ශනය | 90 | 74 |